**පරිගණක ජාලකරණය පිළිබඳ විශේෂ මාර්ගගත පුහුණු වැඩසටහන (CCNAv7) සඳහා ශිෂ්‍යත්ව ලබා දීම.**

පාසල් සිසුන් සඳහා යෝග්‍ය වන පරිගණක ජාලකරණය පිළිබඳ විශේෂ මාර්ගගත පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) මඟින් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. මෙම වැඩසටහන යටතේ පාසල් සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 2000 ක් ලබා දීමටත්, පුහුණු වැඩසටහන අවසානයේ අන්තර්ජාතිකව පිළිගත් සහතිකයක් ලබා දීමටත්, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මඟින් කටයුතු කරනු ලැබේ.

02. පහත සඳහන් වෙබ් සැබැඳිය (web link) ඔස්සේ 2020 සැප්තැම්බර් මස සිට මෙම වැඩසටහන සඳහා සිසුන්ට ලියාපදිංචි විය හැකි අතර මෙම පුහුණු වැඩසටහන පිළිබඳ හා පැවැත්වෙන කාල පරාස පිළිබඳ විස්තර

වෙබ් සබැඳිය - http://www.sliit.lk/scholarship _CCNA

03. තවද, ලබාදෙන ශිෂ්‍යත්ව ප්‍රමාණය 2000 ක් බැවින් ඉල්ලුම් කරනු ලබන සිසුන්ගේ සුදුසුකම් මත එම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මඟින් සිදු කරනු ලැබේ.

04. ඒ අනුව, මෙම පරිගණක ජාලකරණය පිළිබඳ විශේෂ මාර්ගගත පුහුණු වැඩසටහන හැදෑරීම සඳහා පහත සිසුන්ට හැකියාව පවතී.

i. 9 – 13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන තොරතුරු තාක්ෂණ විෂයය හදාරන සිසුන්

ii. 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ පරිගණක දෘඩාංග හා ජාලකරණ පාඨමාලාව ඇතුළු තොරතුරු තාක්ෂණ පාඨමාලා හදාරන සිසුන්

iii. කලාපීය තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානවල තොරතුරු තාක්ෂණ පාඨමාලා, හදාරන සිසුන්